## චිත්‍රපට කලාකරුවන් හා චිත්‍රපට කාර්මිකයන් සඳහා වූ ජාතික චිත්‍රපට සංස්ථා භාරය - 2017

---

චිත්‍රපට කලාකරුවන් හා චිත්‍රපට කාර්මිකයන් සඳහා වූ ජාතික චිත්‍රපට සංස්ථා භාරයේ 2017 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13 ( I ) වගන්තිය සහ 1986 අංක 3 දරන චිත්‍රපට කලාකරුවන් හා චිත්‍රපට කාර්මිකයන් සඳහා වූ ජාතික චිත්‍රපට සංස්ථා භාරය පනතේ 11(4) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2) (සී) වගන්තිය ප්‍රකාර සංස්ථා භාරයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් සහ නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට ( ISSAI 1000 – 1810 ) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව්කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරුකිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරුකිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කිරීම පිණිස භාරයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් භාරයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂයය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3 )හා (4 ) උප වගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන

## 2.1 මතය

මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට චිත්‍රපට කලාකරුවන් හා කාර්මිකයන් සඳහා වූ ජාතික චිත්‍රපට සංස්ථා භාරයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වය පිළිඹිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

2013 වර්ෂයේ සිට ගෙවිය යුතු බදු ලෙස දක්වා ඇති රු.72,696 ක මුදල සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

### 2.2.2 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) භාරකාර මණ්ඩලයක අනුමැතියකින් තොරව විශ්‍රාම වැටුප්ලාභී කලාකරුවන් 15 දෙනෙකුට 2014 වර්ෂයේ ජනවාරි සිට සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වා එක් අයකුට මාසයකට රු.2000 බැගින් එකතුව රු. 1,440,000 ක් ගෙවා තිබුණි. එම ගෙවීම් කිරීම සඳහා කලාකරුවන් තෝරාගත් ආකාරය පිළිබඳ විස්තර විගණනයට ඉදිරිපත් නොවුණි.

(ආ) භාරකාර මණ්ඩල පනතේ 6(2)(1)(ඉ) වගන්තිය ප්‍රකාරව භාරකාර මණ්ඩලයේ අභිමතය ලබා ගැනීමෙන් තොරව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 වන විට රු.12,287,172 ක් ආයෝජනය කර තිබුණි. එමෙන්ම වර්ෂ ගණනාවක සිට භාරකාර මණ්ඩලයක් නොමැති බව විගණනයේ දී නිරීක්ෂණය විය.

## 3. මූල්‍ය සමාලෝචනය

## 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සංස්ථා භාරයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 117,072 ක අතිරික්තයක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 21,221ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 138,293 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි. පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ආයෝජන ආදායම් රු. 126,463 කින් වැඩිවීම ඉහත වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

-------------------------------

### 4.1 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය

--------------------------------------

1986 අංක 3 දරන චිත්‍රපට කලාකරුවන් සහ චිත්‍රපට කාර්මිකයන් සඳහා වූ පනතේ 3.1 හා 3.2 වගන්ති ප්‍රකාරව භාරකාර මණ්ඩලයක් නොමැති වීම හේතුවෙන් භාරයේ පහත කාර්යයන් ඉටුකිරීමට නොහැකි වී තිබුණි.

(අ) ප්‍රතිලාභීන් වෙනුවෙන් ඉතිරිකිරීමේ අරමුදල් පිහිටුවීම, සකසුරුවම් සමිති ඇති කිරීම, ණය ලබාදීම, නිවාස පහසුකම් ලබාදීම ආදී අරමුණු ඉටුකර ගැනීම.

(ආ) පෙරොත්තු ලේඛනයේ සිටින කලාකරුවන් 102 දෙනෙකු සඳහා ප්‍රතිලාභ ලබා දීමේ වැඩපිළිවෙළක් සකස්කිරීම.

(ඇ) විශ්‍රාම ප්‍රතිලාභ ලබන කලාකරුවෙකු හෝ කාර්මිකයෙකු මියගිය විට ඒ වෙනුවට පොරොත්තු ලේඛනයෙන් සුදුසුකම් ලබන විශ්‍රාමලාභියෙකු තෝරාගැනීම යාවත්කාලීනව සිදු කිරීම.

### 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අරමුදලේ සාමාජිකයෙකු ජීවත්ව සිටීද යන්න පිළිබඳව නිසි තහවුරුකර ගැනීමේ ක්‍රමවේදයක් අනුගමනය කිරීමකින් තොරව මාස්පතා විශ්‍රාම දීමනාව බැංකුගත කර තිබුණි.

(ආ) බැංකුගත නොකර මුදල් ලබා ගන්නා එක් විශ්‍රාම වැටුප් ලාභියෙකු රු.36,000 ක් වූ මාස 18 ක විශ්‍රාම වැටුප් ලබාගැනීම සඳහා ඉදිරිපත් වී නොතිබූ අතර අදාල මුදල් හිමිකම් නොපෑ විශ්‍රාම වැටුප් වෙන්කිරීමේ ගිණුමකට බැරකර තිබුණි. එහෙත් විශ්‍රාම දීමනාව ලබා නොගැනීමට හේතු සොයාබලා ඒ සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සිදුකර නොතිබුණි.

(ඇ) පනතෙහි 6(2) (අ) උප වගන්තිය අනුව සුදුසු ක්‍රම උපයෝගී කරගෙන අරමුදල් උපයා ගැනීමට හැකියාව තිබුණ ද එවැනි කිසිදු වැඩසටහනක් හෝ ක්‍රියාමාර්ගයක් ප්‍රවර්තන වර්ෂය තුළදී ක්‍රියාත්මක කර නොතිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

------------------------------------------

### 5.1 අභ්‍යන්තර විගණනය

------------------------

චිත්‍රපට කලාකරුවන් හා චිත්‍රපට කාර්මිකයන් සඳහා වූ ජාතික චිත්‍රපට සංස්ථා භාරය සම්බන්ධව මුදල් රෙගුලාසි 133 (1) (අ) ප්‍රකාරව අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර භාරයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුවේ.

| **පද්ධති හා පාලන ක්ෂේත්‍ර** | **නිරීක්ෂණ** |
|---|---|
| (අ) විශ්‍රාම වැටුප් ගෙවීම | විශ්‍රාම වැටුප් ලාභීන් ජීවත් වන බව හඳුනා ගැනීම සම්බන්ධයෙන් අභ්‍යන්තර පාලනයක් නොවීම සහ පොරොත්තු ලේඛනය යාවත්කාලීන නොකිරීම. |
| (ආ) අරමුදල වර්ධනය කර ගැනීම | ප්‍රතිලාභ ලබාදීමට ප්‍රමාණවත් වන පරිදි අරමුදල වර්ධනය කර නොගැනීම. |